# චීන සංස්කෘතිය සහ මහායාන බුදු සමය

පූජ්‍ය. කතරගම උපරතන හිමි*

චීනයට බුදු සමය හඳුන්වා දෙන ලද්දේ ක්‍රි.ව. 1 දී ය. "හන් " රාජ වංශයේ රාජ්‍ය ආගම කොන්ෆියුසියස් දහම විය. චීනයට බුදු සමය ගෙන එන ලද්දේ වෙළඳුන් විසිනි. එසේම චීනයට බුදු සමය පැමිණෙන්නේ විදේශීය භාෂාවක අවශ්‍යතාවය නොවූ යුගයක ය. එනිසා චීනයට බුදු සමය හඳුන්වාදීමේ දී මුහුණ පෑ අභියෝග රාශියකි. බුදු සමයේ සංකල්පයන්ට අදාළ වචන එහි නොතිබීම හා චිත්‍ර මූලික බසක් තිබීම ඉන් ප්‍රධාන වේ. මිංති අධිරාජයා බුදු සමයේ ආගමනය සිහිනෙන් දැකීම චීනයේ බුදු සමය මුල් බැස ගැනීම ලෙස හැඳින්වේ. ජනයා අතරට බුදු සමය ගෙන යාමට විවිධ උපක්‍රම භාවිත කරයි. චීනයෙහි බුදු සමය ස්ථාපිත වීමට බොහෝ සාධක බලපාන ලදී. පින්කම් මගින් පැරණි පව් ගෙවා ගැනීමට හැකි යයි චීන ජනයා සිතූ අතර දේශපාලන ව්‍යාකූලතා ඇතිවීමත් සමග කොන්ෆියුසියස් දහමට එරෙහිව ගැටලු මතුවීමට පටන් ගත්හ. කැරැලි ගහණ වූ මෙම කාලය අඳුරු ඉගෙනුම් සමය ලෙස හඳුන්වන අතර චීන ජනයා වෙත බුදු දහම ගෙනයාමට විවිධ උපක්‍රම අනුගමනය කිරීම හා සංකල්ප ගැළපීම දැකිය හැකි ය. තවද බුදු දහම විවිධ වෙනස්කම්වලට භාජනය වූ අතර බුදු සමයෙන් ලද අග්‍රගන්‍ය ප්‍රතිඵලය වූයේ විශිෂ්ඨ චීන සංස්කෘතියක් බිහිවීම හා චන් හෙවත් සෙන් බුදු දහම බිහිවීම යි.

ප්‍රමුඛ පද - කොන්ෆියුසියස් දහම, බුදු දහම, සෙන් බුදු දහම

* බෞද්ධ අංශය, කැලණිය විශ්වවිද්‍යාලය Katharagamauparathana92@gmail.com